4 වන ජාත්‍යන්තරයේ ශාඛාව
4 வது அகிலத்தின் கிளை
Section of the 4th international

# නව සම සමාජ පක්ෂය
# நவ சம சமாஜ கட்சி
# NAVA SAMA SAMAJA PARTY

17, බැරැක්ක පටුමග, කොළඹ 02. இல.17, பெரக் ஒழுங்கை, கொழும்பு 02. 17, Barrack Lane, Colombo 02.
Tel:. 011 2430621 Fax:011 2305963 email - nssp.lk@gmail.com Web:www.nssp.info

2021.11.24

**පුවත්පත් නිවේදනය -**
**සියළු ජනමාධ්‍ය වෙත**

මේ දින වල සුපුරුදු පරිදි, දෙමළ ජනතාව විසින් තම අයිතිවාසිකම් - එනම් යුක්තිය සාධාරණය හා නිදහස ලබාගැනීම සඳහා ගෙන ගිය අරගලයන් හි දී මියගිය සිය ආදරණීයයන් අනුස්මණය කිරීම වෙනුවෙන්, උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි ගන්නා පියවරයන් වැලැක්වීම සඳහා ආණ්ඩුවත් එහි නියෝග මත ක්‍රියාත්මක වන ආරක්ෂක අංශ හා පොලිසියත් පියවර ගනිමින් ඇති බව අපගේ අවධානයට ලක් වී තිබේ.

මනුෂ්‍යයන්ගේ අයිතිවාසිකම් යන්නෙන් අදහස් වන්නේ පුද්ගලික කරුණක් නොව, තමන්ගේ ජාතියේ මෙන්ම තමන් අදහන ආගමේ උන්නතිය සලසා ගැනීමේ අයිතිය යි. ඒවාට අභියෝග එල්ලවන්නේ නම්, කඩාකප්පල් වන්නේ නම් ඒවා ආරක්ෂා කර ගැනීම සඳහා සටන් කිරීමේ යුක්ති සහගත අයිතියක් ඔවුන්ට තිබේ.

ඒ වෙනුවෙන් අනෙක් ජනතාවන්ගේ අනුග්‍රහය ලබා ගැනීමේ අයිතිය ද ඒ හා සම්බන්ධව පවතී. එයට බාධා පමුණුවන්නේ නම්, එම රට ප්‍රජාතන්ත්‍රවාදීව ක්‍රියාත්මක වන රටක් හැටියට පිලිගැනීමට නොහැකිය.

එම බාධාවන්ට විරුද්ධව නැගී සිට, එකතුව සංවිධානය වී තම නිදහස සඳහා සටන් කරන ලද්දේ මේ රටේම මනුෂ්‍යයින් විසින්ය.

ජාතික අයිතිය යනු, ඒ වෙනුවෙන් කථා කිරීම පමණක් නොවේ. පෙරකී පරිදි ඒ වෙනුවෙන් සංවිධානය වී සටන් කිරීමටත්, ඒ ගැන ජාත්‍යන්තර වශයෙනුත් මැදහත් වෙමින් තමන්ට තම ජාතිය ලෙස පෙනී සිටීමේ අයිතිය ලබා දියයුතුය යනුවෙන් ජාත්‍යන්තර මනුෂ්‍ය ප්‍රජාව අතර උද්ඝෝෂණය කිරීමටත් පවතින අයිතිය වේ.

මේ සියල්ල එක්සත් ජාතීන් විසින් පිලිගත්තා වූ මූලධර්ම වෙයි.

ඒ අනුව මෙකී ජාතික අයිතීන්ට ගරු කරමින් ක්‍රියා කරන ලෙසත්, එම අයිතීන් ක්‍රියාත්මක කර ගැනීම සඳහා වූ සටනේ දී මියගිය වුන් සිහිකිරීමට දෙමළ ජනතාවට ඇති අයිතියට බාධා කිරීමේ අමානුෂික පිළිවෙතින් ඉවත් වන ලෙසත් අපි ලංකාණ්ඩුවේ බලධාරීන්ට බල කර කියා සිටිමු.

මහාචාර්ය වික්‍රමබාහු කරුණාරත්න

Prof. Vickramabahu Karunaratne
General Secretary
Nava Sama Samaja Party
17, Barrack Lane,
Colombo - 02.